# 2018

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

# ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව මගින් ක්‍රිස්තියානි ධර්මයේ සහ සංස්කෘතියෙහි පැවැත්ම හා වර්ධනය සඳහා රජයේ ප්‍රතිපත්තිය අනුව වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

## දැක්ම

ක්‍රිස්තියානි ජනතාවගේ සුභසිද්ධිය සඳහා ක්‍රියාකිරීම

## මෙහෙවර

ක්‍රිස්තියානි ධර්මයේ සහ සංස්කෘතියෙහි වටිනාකම් හා විශ්වාසයන් සමාජයේ පිළිගත් ආකාරයට ප්‍රවර්ධනය කිරීම

## අරමුණ

සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීම සඳහා ආගමික වටිනාකම් ජනතාව තුළ වර්ධනය කරනු පිණිස ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්පාදනයකිරීම හා අධීක්ෂණය.

# ක්‍රියාකාරකම්

1. වන්දනාගමන් ආඥාපනත යටතේ හා කතෝලික සභාව විසින් ප්‍රකාශිත ජාතික සිද්ධස්ථානයන්හි සංවර්ධන කාර්යයන් සිදුකිරීම.
2. ප්‍රසිද්ධ සිද්ධස්ථානයන්හි පැවැත්වෙන වාර්ෂික මංගල්‍යයන් සඳහා ආධාර ලබාදීම.
3. සංවර්ධන සහයයන්
4. ආර්ථික සහය අවශ්‍ය කිතුණු දේවස්ථානවල සංවර්ධන හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ආධාර ලබාදීම.
5. කිතුණු දහම් අධ්‍යාපන කටයුතු නංවාලීම සහ දහම් ගුරුසේවා ඇගයීම් කටයුතු ක්‍රියාත්මක කිරීම.
6. කිතුණු ආගමික සාහිත්‍ය කලා සහ සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීම.
7. බයිබලීය දැනුම වර්ධනය කිරීම උදෙසා බයිබල් දැනුම මිනුම තරගය පැවැත්වීම.
8. කිතුණු ජනතාවගේ අති උතුම් මංගල්‍ය වූ පාස්කු මංගල්‍යට අදාල වැඩසටහන් සඳහා දායකත්වය ලබාදීම.
9. කිතුණු ජනතාවගේ ගෞරවාදරයට පත් උතුම් මංගල්‍ය වූ නත්තල් උත්සවය සඳහා දායකත්වය ලබාදීම හා රාජ්‍ය නත්තල් උත්සවය සංවිධානය කිරීම.
10. ජාතික හා ආගමික වශයෙන් වැදගත් උත්සව සංවිධානය කිරීම.
11. කිතුණු ජනතාවගේ අධ්‍යාත්මික හා පෞරුෂත්ව සංවර්ධනය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
12. දේවස්ථාන ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය කිරීම.
13. ආගමික කටයුතු සඳහා පැමිණෙන විදේශික පැවිදි හා ගිහි පාර්ශව වෙත වීසා නිර්දේශ ලබා දීම සහ වන්දනාකරුවන් සඳහා අනුග්‍රාහ වීසා නිර්දේශ නිකුත් කිරීම.
14. ආගමික ආයතන සඳහා ජල විදුලි හා තීරුබදු සහන ලබා දීම.
15. කිතුණු දේශීය පැවිදි පාර්ශව සඳහා විදේශ ගමන් බලපත්‍ර හා හැඳුනුම්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීම.
16. ක්‍රිස්තියානි ආගමික කටයුතු දේපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන විශේෂ ව්‍යාපෘතීන්
17. කතෝලික දේවස්ථාන, දහම් පාසල් හා ආගමික ආයතන පිළිබදව ලියාපදිංචි සහතික නිකුත් කිරීම හා දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.

# පටුන


පිටු අංකය

හැඳින්වීම, දැක්ම, මෙහෙවර, අරමුණ හා ක්‍රියාකාරකම් 2-3

පළමුවන පරිච්ඡේදය
ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ ව්‍යුහය 7
- පාලන අංශය 8-9
- සංවර්ධන අංශය 10
- ගිණුම් අංශය 11

2018 වසර තුළදී දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය

සඳහා ලබා දුන් පුහුණු පාඨමාලා 12

දෙවන පරිච්ඡේදය
වන්දනා ගමන් ආඥාපනත යටතේ හා කතෝලික සභාව විසින්
ප්‍රකාශිත ජාතික සිද්ධස්ථානයන්හි සංවර්ධන කාර්යයන් සිදුකිරීම. 14

තුන්වන පරිච්ඡේදය
ප්‍රසිද්ධ දේවස්ථානයන්හි පැවැත්වෙන වාර්ෂික මංගල්‍යයන් සඳහා
ආධාර ලබාදීම 16

හතරවන පරිච්ඡේදය
සංවර්ධන සහයයන් 18-19

පස්වන පරිච්ඡේදය
ආර්ථික සහය අවශ්‍ය කිතුණු දේවස්ථානවල සංවර්ධන හා
ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ආධාර ලබාදීම. 21

හයවන පරිච්ඡේදය
දේවස්ථාන ඉදිකිරීම් පුනරුත්ථාපනය කිරීම්
හා යටිතල පහසුකම් සංවර්ධනය 23-25

හත්වන පරිච්ඡේදය
කිතුණු දහම් අධ්‍යාපන කටයුතු නංවාලීම සහ දහම් ගුරුසේවා
ඇගයීම් කටයුතු ක්‍රියාත්මක කිරීම. 27-33

අටවන පරිච්ඡේදය
කිතුණු ආගමික සාහිත්‍ය කලා සහ සංස්කෘතික කටයුතු
ප්‍රවර්ධනය කිරීම. 35-38

නවවන පරිච්ඡේදය
බයිබලීය දැනුම වර්ධනය කිරිම උදෙසා බයිබල් දැනුම මිනුම
තරගය පැවැත්වීම. 40-42

දහවන පරිච්ඡේදය
කිතුණු ජනතාවගේ වන්දනාවට පාත්‍රවූ පාස්කු වැඩසටහන්
සඳහා දායකත්වය ලබාදීම. **44-45**

එකලොස්වන පරිච්ඡේදය
කිතුණු ජනතාවගේ ගෞරවාදරයට පාත්‍රවූ නත්තල් උත්සවය
සඳහා දායකත්වය ලබාදීම හා රාජ්‍ය නත්තල් උත්සවය සංවිධානය කිරීම. **47-52**

දොළොස්වන පරිච්ඡේදය
කිතුණු ජනතාවගේඅධ්‍යාත්මික හා පෞරුෂත්ව සංවර්ධනය අරමුණු කර
ගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. **54-55**

දහතුන්වන පරිච්ඡේදය
2018 දී ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව මගින්
සිදුකරනු ලබන විශේෂ ව්‍යාපෘතීන් **57**

දහහතරවන පරිච්ඡේදය
ඓතිහාසික වටිනාකම් ඇති දේවස්ථාන වල සංවර්ධන හා
ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ආධාර ලබාදීම **59**

පහලොස්වන පරිච්ඡේදය
ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2018 වර්ෂයේ
වැය විෂයන්ට අදාළ වියදම් විස්තරය **61-63**

# පලමුවන පරිච්ඡේදය

## ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ ව්‍යූහය

# ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ වෙසෙන කිතුනු ජනතාව සියවස් ගණනක් මුළුල්ලේ ස්වකීය ආගමික මධ්‍යස්ථාන සමඟ ඒකාබද්ධ වෙමින් සිය ආගමික පූජාවන් පවත්වන ලද නමුත් එකී ආගමික සංවිධාන හා රජය අතර ඍජු ක්‍රමික සබඳතාවක් ගොඩනැගී නොමැත. එසේ නමුත් හැමවිටම සෑම රජයක් යටතේම සිය ආගම් ඇදහීමේ නිදහස ඔවුනට හිමිවිය.

පසුගිය දශකයක පමණ කාලය තුළ 'සියලුම ආගම් වලට සමානව සැළකිය යුතුය'යන සංකල්පය යටතේ කිතුනු ජනතාව හා ඔවුන්ගේ වන්දනාවට පාත්‍රවූ ආගමික සිද්ධස්ථාන කෙරෙහි රජයක් වශයෙන් ඉටුකළ හැකි මෙහෙය ඉතා පුළුල්වෙමින් වර්ධනය වූ අතර කිතු බැතිමතුන් හා පූජ්‍ය පක්ෂය කෙරෙහි රජයේ අවධානය වැඩිවශයෙන් යොමු විය. එහි ප්‍රතිඵලයක් ලෙස කිතුනු ආගමික සංස්ථාව තුළත් ආගමික මධ්‍යස්ථාන හා රජය අතරත් අන්නෝන්‍ය විශ්වාසය හා සම්බන්ධතාවය ක්‍රමවත් ලෙස වර්ධනය විය.

කිතුනු ආගමික වත්පිළිවෙත් ඉටුකරණු වස් පුදපූජා පවත්වමින් ආගමික ඇවතුම් පැවතුම් ගුණ ධර්ම වර්ධනය කිරීමේ මූලික අඩිතාලම ගොඩනගනුයේ ගම්වල හා නගරවල පිහිටි ආගමික සිද්ධස්ථාන මඟිනි. රෝමානු කතෝලික සභාව හා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයට අනුබද්ධ ක්‍රිස්තියානි සභාවන්ගේ එකමුතුව ඇතිව එකී සිද්ධස්ථාන මූලික කරගෙන අධ්‍යාත්මික හා ආකල්පමය වශයෙන් කිතුනු ජනතාව සංවර්ධනය කිරීමටත්, සදාචාර සම්පන්න දූදරුවන් අනාගතයට දායාද කිරීමටත් අවශ්‍ය අනුග්‍රහය රජය හා අනෙකුත් ආයතන මඟින් ලබාදීමත් අපගේ සේවාවයි.

1999 වර්ෂයේ මැයි මසදි කැබිනට් පත්‍රිකාවක් මඟින් සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යංශය යටතේ ක්‍රිස්තියානි ආගමික කටයුතු හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ලෙස ඇරඹි මෙම දෙපාර්තමේන්තුව පසු වර්ෂ කිහිපය තුළ විවිධ වෙනස්කම් වලට භාජනය වෙමින් විවිධ අමාත්‍යංශ මෙන්ම අමාත්‍යවරු යටතේ ක්‍රමිකව විකාශනය වන්නට විය. 2007ක් වූ අගෝස්තු මස 01 වන දින සිට වඩාත් සක්‍රිය දෙපාර්තමේන්තුවක් ලෙස ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව වඩාත් සංවිධිත හා ක්‍රමවත්ව වර්ධනය වූ අතර එකී කාර්යභාරය අංශ හතරක් යටතේ ක්‍රියාත්මක වන්නට විය. ඒවා නම්,

පාලන අංශය

සංවර්ධන අංශය

ගිණුම් අංශය

විගණන අංශය

# පාලන අංශය

දෙපාර්තමේන්තුවේ ආයතනික, පරිපාලන හා කළමනාකරණ කටයුතු මෙහෙයවමින්, අරමුණු ඉටුකිරීමෙහිලා සම්බන්ධීකරණය හා අධීක්ෂණ කටයුතු සිදුකිරීම මෙම අංශයෙන් ඉටු කරනු ලබන කාර්යයයි.එම කාර්යය පහත පරිදි වේ.

1. කාර්ය මණ්ඩලයේ සියලු නිළධාරින්ගේ පෞද්ගලික ලිපිගොනු වලට අදාලව සියලු ආයතනික කටයුතු පවත්වාගෙන යාම.
2. පුරප්පාඩු සඳහා නවක නිළධාරින් බඳවා ගැනීමට අදාලව කටයුතු හා බඳවාගැනීමේ පටිපාටි ක්‍රමවත්ව පවත්වාගෙන යාම.
3. යම් යම් අවස්ථාවලදී ඉල්ලනු ලබන පරිදි ආයතනික තොරතුරු හා වාර්තාවන් ලබාදීම.
4. නිළධාරින්ගේ දේශීය හා විදේශීය පුහුණුවීම් වලට අදාළ රාජකාරි කටයුතු.
5. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, දෙපාර්තමේන්තු චක්‍රලේඛ සහ අනෙකුත් සියලු චක්‍රලේඛ යාවත්කලීනව පවත්වාගෙන යාම.
6. ආයතනයේ දුරකතන, විදුලිය, ජලය, ගොඩනැගිලි හා අනෙකුත් විවිධ වියදම් සම්බන්ධව බිල්පත් නිරවුල් කිරීමට ඉදිරිපත් කිරිම හා නඩත්තු කිරීමේ කටයුතු කිරීම.
7. ආරක්ෂක සේවා සැපයීම,පවිත්‍ර කිරීමේ සේවා සැපයීම, පරිගනක යන්ත්‍ර සේවා කිරීමේ කටයුතු ඡායා පිටපත් යන්ත්‍ර සේවා කිරීම, ෆැක්ස් යන්ත්‍ර හා අනෙකුත් ගිවිසුම්ගත සේවා කටයුතු වලට අදාල සියලු රාජකාරි කිරිම.
8. දෛනික පැමිණීමේ විස්තර යාවත්කාලීනව පවත්වාගෙනයාම, රාජකාරි නිවාඩු, දුම්රිය බලපත්‍ර නිකුත් කිරිම, නිරවුල් කිරිම හා දුම්රිය ප්‍රවේශපත්‍ර ගොනුව නඩත්තු කිරිම.
9. දෛනික පැමිණීමේ විස්තර යාවත්කාලීනව පවත්වාගෙනයාම, රාජකාරි නිවාඩු, දුම්රිය බලපත්‍ර නිකුත් කිරිම, නිරවුල් කිරිම හා දුම්රිය ප්‍රවේශපත්‍ර ගොනුව නඩත්තු කිරිම.
10. අග්‍රහාර විෂයට අදාලව සියලු රාජකාරි කටයුතු.
11. ණය අයදුම්පත් ලබාගැනීම හා ඒවා සම්පූර්ණ කර ගිණුම් ශාඛාවට ඉදිරිපත් කිරීම.
12. වාහන නඩත්තුව හා ප්‍රවාහනයට අදාලව සියලුම රාජකාරී.
13. ආගමික කටයුතු සඳහා පැමිණෙන විදේශික පැවිදි හා ගිහි පාර්ශව වෙත වීසා නිර්දේශ ලබා දීම සහ වන්දනාකරුවන් සඳහා අනුග්‍රාහ වීසා නිර්දේශ නිකුත් කිරීම.
14. ආගමික ආයතන සඳහා ජල විදුලි හා තීරුබදු සහන ලබා දීම.
15. කිතුණු දේශීය පැවිදි පාර්ශව සඳහා විදේශ ගමන් බලපත්‍ර හා හැඳුනුම්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීම.
16. කතෝලික දේවස්ථාන, දහම් පාසල් හා ආගමික ආයතන පිළිබඳව ලියාපදිංචි සහතික නිකුත් කිරීම හා දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.
17. තොරතුරු දැනගැනීමේ පණතේ විධිවිධාන යටතේ බාහිර පාර්ශවයන් වෙත තොරතුරු ලබා දීම.

# දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය 2018.12.31

| අනු අංකය | තනතුරු නාමය | අනුමත කාර්ය මණ්ඩලය | සේවයේ නියුතු කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ. I) | 01 | 00 | 01 |
| 2 | සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ. III) | 01 | 01 | 00 |
| 3 | ගණකාධිකාරී ( ශ්‍රී.ලං.ග.සේ. II/III) | 01 | 00 | 01 |
| 4 | පරිපාලන නිලධාරී | 01 | 00 | 01 |
| | පාලන අංශය | | | |
| 5 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 06 | 06 | 00 |
| | සංවර්ධන අංශය | | | |
| 6 | ව්‍යාපෘති සහකාර | 05 | 00 | 05 |
| 7 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 03 | 03 | 00 |
| 8 | සංවර්ධන නිලධාරී | 33 | 22 | 11 |
| 9 | තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සහකාර III | 01 | 01 | 00 |
| | ගිණුම් අංශය | | | |
| 10 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 06 | 06 | 00 |
| | විගණන අංශය | | | |
| 11 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 | 01 | 00 |
| | අනෙකුත් | | | |
| 12 | රියදුරු | 02 | 01 | 01 |
| 13 | කාර්යාල කාර්ය සහායක | 03 | 01 | 02 |
| 14 | නිවාස භාරකරු | 01 | 01 | 00 |
| 15 | කාර්යාල කම්කරු | 01 | 01 | 00 |
| | මුලු සේවක සංඛ්‍යාව | 66 | 44 | 22 |

- කොන්ත්‍රාක් පදනම මත **2018.08.27** දින සිට වසරක කාල සීමාවක් දක්වා විශ්‍රාමික නිලධාරියෙකු දෙපාර්තමේන්තු ගණකාධිකාරී තනතුරෙහි මේ වන විට රාජකාරි කටයුතු සිදුකරයි.

# සංවර්ධන අංශය

දෙපාර්තමේන්තුව සඳහා මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන හා වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන මුදල් යොදවාගෙන දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කෙරෙන අන්දමේ ව්‍යාපෘති සැලසුම් කිරීම හා ප්‍රගතිය වාර්තා කිරීම. ලැබෙන අරමුදල් යොදවා කරනු ලබන ව්‍යාපෘති ආගමික හා සාමාජික වශයෙන් දියුණුවක් ඇති කිරීම සඳහා දේවස්ථාන කේන්ද්‍ර කරගෙන ක්‍රියාත්මක කරවීමට අදාල කටයුතු සංවිධානය හා සමායෝජනය කිරිම. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වලට අවශ්‍ය අරමුදල් ලබාදීම හා ප්‍රගතිය මැන බැලීම.

ඉහත කාර්යභාරය සංවර්ධන අංශය මඟින් පහත සඳහන් පරිදි ක්‍රියාත්මක කරනු ලබයි.

01. වන්දනා ගමන් ආඥාපනත යටතේ හා කතෝලික සභාවවිසින් ප්‍රකාශිත ජාතික සිද්ධස්ථානයන්හී සංවර්ධන කාර්යයන් සිදුකිරිම.

02. ප්‍රසිද්ධ සිද්ධස්ථානයන්හි පැවැත්වෙන වාර්ෂික මංගල්‍යයන් සඳහා ආධාර ලබාදීම.

03. ආර්ථික සහය අවශ්‍ය කිතුණු දේවස්ථානවල සංවර්ධන සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ආධාර කිරීම.

04. කිතුනු දහම් අධ්‍යාපන කටයුතු නංවාලීම සහ දහම් ගුරු සේවා ඇගයීම් කටයුතු ක්‍රියාත්මක කිරිම.

05. කිතුනු ආගමික සාහිත්‍ය, කලා සහ සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරිම.

06. කිතුනු ජනතාවගේ ගෞරවයට පාත්‍ර වූ නත්තල් උත්සව සඳහා දායකත්වය ලබාදීම.

07. කිතුනු ජනතාවගේ වන්දනාවට පාත්‍ර වූ පාස්කු වැඩසටහන් සඳහා දායකත්වය ලබාදීම

08. කිතුනු ජනතාවගේ අධ්‍යාත්මික හා පෞරුෂත්ව සංවර්ධනය අරමුණු කර ගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.

09. ජාතික හා ආගමික වශයෙන් වැදගත් උත්සව සංවිධානය කිරිම.

## ගිණුම් අංශය

මෙම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ හා ගණකාධිකාරිගේ අධීක්ෂණය යටතේ ආයතන අංශය හා සංවර්ධන අංශය මඟින් ඉටුකරනු ලබන සියලුම කාර්යභාරයන්ගේ අවසන් ක්‍රියාවලිය වන මූල්‍යමය වගකීම නිසියාකාරව මෙහෙයවීම හා නිවැරදිව ඉටුකරනු ලැබීම මෙහි කාර්යභාරය වෙයි. එම කාර්ය පහත සඳහන් ආකාරයෙන් සිදුකරනු ලබයි.

**01** සියලුම ගෙවීම් කටයුතු සම්බන්ධවවවුචර්පත් භාරගෙන ඒවායේ ගණිතමය නිරවද්‍යතාවය තහවුරු කොට වවුචරයට අදාලව හා ප්‍රමානවත් පරිදි ප්‍රභව ලියවිලි ඇත්ද යන්න පරික්ෂාකර, මුදල් රෙගුලාසි හා විවිධ මුදල් සීමාවන් තුළ ගෙවීම් සඳහා නිසි අධිකාරි බලය ලැබී ඇත්ද යන්න තහවුරු කොට වියදම සහතික කිරිම සඳහා ඉදිරිපත් කිරිම.

**02** සහතික කරනලද වවුචර්පත් මුදල් පොතට ඇතුලත් කොට නිවැරදි පරිදි ගෙවීම් කටයුතු කිරීම සඳහා මුදල් පොත නඩත්තු කිරිම හා චෙක්පත් ලිවීම.

**03** වැටුප් සැකසීමේ කටයුතු කිරිම හා වැටුප් අවකරණ ලේඛන නඩත්තු කිරිම.

**04** වාර්ෂික විසර්ජන ගිණුමට අදාල චක්‍රලේඛයේ උපදෙස් පරිදි සකස් කිරීම හා විගණන විමසුම් වලට පිළිතුරු සැකසීම.

**05** සුළු මුදල් අත්තිකාරම් පවත්වාගෙන යාම හා සුළු මුදල් පොත නඩත්තු කිරිම, බැංකු ගනුදෙනු ඇතුළුව, මුදල් පෙට්ටියේ දෛනික මුදල් ශේෂ තහවුරු වන පරිදි පවත්වාගෙන යාම.

**06** ගබඩාව භාරව කටයුතු කිරිම, ගබඩාවට භාණ්ඩ ලබාගැනීම හා නිකුත් කිරිම, අදාල ලේඛන නඩත්තු කිරිම.

**07** වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරිම හා ඊට අදාළ පාර්ශවයන් හා සම්බන්ධව දත්ත එක්රැස් කිරිම.

**08** වැය ලෙජරය නඩත්තු කිරිම, වරින්වර අයවැය ලේඛනයේ ප්‍රතිපාදන හා සත්‍ය වියදම් සසඳා බලා ඉදිරි කාලය සඳහාප්‍රතිපාදන ප්‍රමාණවත් නොවේ නම්, අදාළ පරිදි මුදල් රෙගුලාසි **66** පරිදි ප්‍රතිපාදන මාරුකර ගැනීම මෙන්ම අමතර ප්‍රතිපාදන මාරුකර ගැනීම හා අමතර ප්‍රතිපාදන ලබා ගැනිමට කටයුතු කිරිම.

**09** පොදු තැන්පත් ගිණුම පවත්වාගෙන යාම සහ මාසික ගිණුම් වාර්තා සකස්කර නියමිත දිනට පෙර යැවීමට කටයුතු කිරිම.

**10** භාණ්ඩාගාර මුද්‍රිත සටහන් පරික්ෂා කිරීම, මාසික අග්‍රිම අයදුම්පත පිළියෙල කර නියමිත දිනට පෙර භාණ්ඩාගාරය වෙත යැවීම.

**11** සියලුම මිළදී ගැනීමේ කටයුතු හා ඊට අදාළ ටෙන්ඩර් කැඳවීම, මිළදී ගන්නා ලද වට්ටෝරු භාණ්ඩ විෂයභාර නිළධාරි වෙත නිසි පරිදි භාරදීම හා සියලු මිළදී ගැනීම් වෙනුවෙන් වවුචර්පත් සැකසීම හා ඒවා ගෙවීම් කිරිමට ඉදිරිපත් කිරිම.

**12** ගෙවීම් කිරිමේදි අය කරන ලද මුද්දර ගාස්තු හා රැඳවුම් බදු නියමිත දිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරිම.

**13** මාසිකව බැංකු සැසඳුම් විස්තරය සකස් කිරිම.

**14** බාහිර රාජ්‍ය ආයතන වෙත ප්‍රතිපාදන මාරුකිරිම හා ඊට අදාළ හර නිවේදන ගිණුම්ගත කිරිමේ කටයුතු සිදුකිරිම.

<u>ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ ගොඩනැගිල්ල</u>

**2018.01.08** දින සිට **2020.01.07** දින දක්වා වසර **02**ක කාලයක් සඳහා ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීමකින් පසුව තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලද තක්සේරුවට අනුව සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ හා ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය අනුව රු. **185,000.00**ක මාසික කුළී වටිනාකමක් මත **155/10**, කාසල් වීදිය, කොළඹ **08** ස්ථානය ලබා ගන්නා ලදී.

**2018 වසර තුළදී දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා පහත සඳහන් පරිදි පුහුණු පාඨමාලා සඳහා අවස්ථාව සලසා දී ඇත.**

| අනු අංකය | වැඩසටහන | දිනය | සහභාගී වූ නිළධාරීන් | මුදල |
|---|---|---|---|---|
| 1 | ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි පිළබඳ වැඩමුළුව | 2018/03/08,09 | ඩබ්.එම්.පී ජයවර්ධන මිය | 8,500.00 |
| 2 | තෙදින සේවාරම්භක පුහුණුව | 2018/03/19,20,21 | ඩබ්.එස්.කේ ප්‍රනාන්දු මිය<br>ටී.ජී.එස් ධම්මිකා මිය | 24000.00 |
| 3 | රියදුරන්ගේ යුතුකම් හා වගකීම් | 2018/03/26,27 | ඩී.ජේ.එම්.ඩී.එස් නිශාන්ත මයා | 8,500.00 |
| 4 | දෙමළ පුහුණුව | පැය 380 | දෙපාර්තමේන්තු නිලධාරීන් | 171,000.00 |
| 5 | සිංහල රාජකාරී ලිපි ලිවීම ලිඛිත භාෂණය | 2018/03/19,20 | පී.ඒ.එල්.එස් මුණිදාස මිය<br>කේ.ඒ.එල්.එස් කැලැපිටිය මිය | 13000.00 |
| 6 | ප්‍රවාහන කළමණාකරණය | 2018/03/16 | ජී.එස්.ආර් සිල්වා මයා | 5,000.00 |
| 7 | ව්‍යාපෘති නියාමනය හා ඇගයීම | 2018/06/28,29 | ඩබ්.එම්.පී ජයවර්ධන මිය<br>කේ.ඒ.එල්.එස් කැලැපිටිය මිය | 13,600.00 |
| 8 | නායකත්වය පෞරුෂ සංවර්ධනය | 2018/08/16,17 | ටී.ජී.එස් ධම්මිකා මිය | 8,500.00 |
| 9 | කාර්යාල කාර්ය සහයකයින්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහල දැමීම | 2018/08/27,28 | එස්.ජී.කේ.ඩී.ජී.එන් සමරතුංග මිය | 8,500.00 |
| 10 | ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | 2018/08/30,31 | ජී.එස්.ආර්.සිල්වා මයා<br>කේ.ජී.එන් හංසිකා මෙය<br>එම්.ඒ.එස් ද කොස්තා මෙය | 26,000.00 |
| 11 | කාර්යාභිවර්ධන පුහුණුව | 2018/09/03,04 | ආර්.ඩබ්.එම්.කේ.අයි.කේ කෝරලේගෙදර මෙය<br>බී.එම්.එම්.එන් බස්නායක මෙය | 17,000.00 |
| 12 | භාණ්ඩ සමීක්ෂණය | 2018/08/30,31 | ඩබ්.එස්.කේ ප්‍රනාන්දු මිය<br>ඩබ්.සී.ආර් ප්‍රනාන්දු මිය | 26,000.00 |
| 13 | මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම | 2018/09/19,20,21 | ඩී.එස්.පී චාමර මයා | 18,000.00 |
| 14 | වැටුප් පරිවර්ථන | 2018/09/20,21 | ඊ.ඒ.ආර්.ඊ ජයසූරිය මෙය | 8,500.00 |
| 15 | රාජ්‍ය අංශය තුළ මුදල් රෙගුලාසි | 2018/09/17,18 | පී.ඒ.එල්.එස් මුණිදාස මිය<br>ඩබ්.එස්.කේ ප්‍රනාන්දු මිය<br>එම්.ජී.ඩී නිර්මලීන් මෙය | 39,000.00 |
| | මුළු මුදල | | | 394,600.00 |

# දෙවන පරිච්ඡේදය

## වන්දනා ගමන් ආඥාපනත යටතේ හා කතෝලික සභාව විසින් ප්‍රකාශිත ජාතික සිද්ධස්ථානයන්හි සංවර්ධන කාර්යයන් සිදුකිරීම.

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

**වන්දනා ගමන් ආඥාපනත යටතේ හා කතෝලික සභාව විසින් ප්‍රකාශිත ජාතික සිද්ධස්ථානයන්හි සංවර්ධන කාර්යයන් සිදුකිරිම.**
**203-02-01-11-2205**

| දේවස්ථානය | වැඩසටහන | මුදල |
|---|---|---|
| තලවිල සාන්ත ආනා සිද්ධස්ථානය | වන්දනාකරුවන් සඳහා වැසිකිලි පද්ධතියක් ඉදිකිරීම | **1,550,000.00** |
| වැලිගම සුවසහනයේ දේවස්ථානය | වන්දනාකරුවන් සඳහා වැසිකිලි පද්ධතියක් ඉදිකිරීම | **1,019,541.50** |
| කට්ටිමහන සාන්ත ආනා දේවස්ථානය | වන්දනාකරුවන් සඳහා වැසිකිලි පද්ධතියක් ඉදිකිරීම | **1,430,458.50** |
| | එකතුව | **4,000,000.00** |

# තුන්වන පරිච්ඡේදය

## ප්‍රසිද්ධ සිද්ධස්ථානයන්හි පැවැත්වෙන වාර්ෂික මංගල්‍යයන් සඳහා ආධාර ලබාදීම.

**ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව**

## වන්දනාගමන් ආඥාපනත යටතේ හා කතෝලික සභාව විසින් ප්‍රකාශිත ප්‍රසිද්ධ සිද්ධස්ථානයන්හි මංගල්‍ය උත්සව කටයුතු සඳහා දායකත්වය ලබාදීම.

වන්දනා ගමන් ආඥා පනත යටතේ හා කතෝලික සභාව විසින් ප්‍රකාශිත ප්‍රසිද්ධ සිද්ධස්ථාන වල පැවැත්වෙන වාර්ෂික මංගල්‍යයන් වෙනුවෙන් පැමිණෙන වන්දනාකරුවන් සඳහා යටිතල පහසුකම් සැළසීම - 2018

වැය ශීර්ෂය - 203-02-01-4(1508)

| | පදවිය | දේවස්ථානය | වැඩසටහන | මුදල (රු) |
|---|---|---|---|---|
| 1 | කුරුණෑගල | මහ ගල්ගමුව සාන්ත ජුසේවාස් සිද්ධස්ථානය | මංගල්‍යය | 600,000.00 |
| | | කට්ටිමහන ශාන්ත ආනා සිද්ධස්ථානය | අගෝස්තු මංගල්‍යය | 400,000.00 |
| 2 | ගාල්ල | මාතර අප ස්වාමි දුවගේ සිද්ධස්ථානය | වාර්ෂික මංගල්‍යය | 500,000.00 |
| | | වැලිගම සුවසහනයේ දේවස්ථානය | වාර්ෂික මංගල්‍යය | 400,000.00 |
| 3 | කොළඹ | තේවත්ත ලංකා අප ස්වාමි දුවගේ සිද්ධද්ථානය | වාර්ෂික මංගල්‍යය | 500,000.00 |
| 4 | හලාවත | තලවිල ශා.ආනා මුනිතුමියගේ සිද්ධස්ථානය | මාර්තු මංගල්‍යය | 750,000.00 |
| | | මාරවිල ශ්‍රී කුරුස සිද්ධස්ථානය | වාර්ෂික මංගල්‍යය | 100,000.00 |
| | | තලවිල ශා.ආනා මුනිතුමියගේ සිද්ධස්ථානය | අගෝස්තු මංගල්‍යය | 737,300.00 |
| | | පල්ලෙකණ්ඩාල් මංගල්‍යය වෙනුවෙන් | වාර්ෂික මංගල්‍යය | 29717.54 |
| 5 | මන්නාරම | ඓතිහාසික මරද මඩු මැනියන්ගේ සිද්ධස්ථානය | ජූලි මංගල්‍යය | 1,000,000.00 |
| 6 | | ඓතිහාසික මරද මඩු මැනියන්ගේ සිද්ධස්ථානය | අගෝස්තු මංගල්‍යය | 1,000,000.00 |
| 7 | මහනුවර | වාසලකෝට්ටේ ශාන්ත අන්තෝනි මුනිදුන්ගේ දේවස්ථානය | ජූනි මංගල්‍යය | 600,000.00 |
| 8 | යාපනය | සුභ ගමනේ රාජේශ්වරියගේ දේවස්ථානය | වාර්ෂික මංගල්‍යය | 50,000.00 |
| මුළු මුදල | | | | 6,667,017.54 |

# හතරවන පරිච්ඡේදය

## සංවර්ධන සහයයන්

## ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

## සංවර්ධන සහයයන් 203-02-01-2202

දේවස්ථාන, දහම් පාසල් හා ආගමික මධ්‍යස්ථානයන්හි ප්‍රතිසංස්කරණයන්, නව ඉදිකිරීම් හා සංවර්ධන ක්‍රියාදාමයන් සඳහා මූල්‍ය සහය දැක්වීම මේ යටතේ සිදු කෙරේ. ඒ තුළින් කිතුනු බැතිමතුන් සඳහා පහසුකම් සැළසීම මෙ හි අරමුණයි.

| | පදවිය | විස්තරය | ලබා දුන් මුදල (රු.) |
|---|---|---|---|
| 1 | ජාතික | කතෝලික රදගුරු සමුළුවේ ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ප්‍රදානය කිරීම | 600,000.00 |
| 2 | | කතෝලික ජනසන්නිවේදනය පිළිබඳ ජාතික මධ්‍යස්ථානයේ ශබ්දාගාරය ඉදිකිරීම සඳහා ප්‍රදානය | 300,000.00 |
| 3 | යාපනය | කච්චතිවු ශා. අන්තෝනි සිද්ධස්ථානයේ වාර්ෂික මංගල්‍යය වෙනුවෙන් | 475,000 .00 |
| 4 | | ධර්මෝපදේශ මධ්‍යස්ථානයට පරිගණකයක් මිල දී ගැනීම සඳහා ප්‍රදානය | 111,000.00 |
| 5 | අනුරාධපුර | පලුගස්දමන දේවස්ථානයේ දහම්පාසැල් ගොඩනැගිල්ල සඳහා | 400,000.00 |
| 6 | බදුල්ල | ශා. මරියා ආසන දෙව්මැදුරේ දහම් පාසැල් ගොඩනැගිල්ල සඳහා | 400,000.00 |
| 7 | කොළඹ | පමුණුගම වැල්ලබඩ ශා. ජූඩ් දේවස්ථානයට පුටු ලබා ගැනීම | 95,000.00 |
| 8 | | පන්නිපිටිය මීසමේ දික්හැතැක්ම දේවස්ථානය් දහම්පාසැල් ගොඩනැගිල්ල සඳහා ප්‍රදානය කිරීම | 300,000.00 |
| 9 | | දළුගම, පමුණුවිල ශා. ජුසේ මුනි දේවස්ථානයට ශබ්ද විකාශන යන්ත්‍ර මිල දී ගැනීම සඳහා ප්‍රදානය කිරීම | 200,000.00 |
| 10 | | රාවතාවත්ත මීසමේ ලුනාව දේවස්ථානයේ දහම් පාසැල් ගොඩනැගිල්ල වෙනුවෙන් ප්‍රදානය කිරීම | 300,000.00 |
| 11 | හලාවත | දුම්මලකොටුව නිර්දෝෂ දේවමාතා දේවස්ථානයේ දහම්පාසැල් ගොඩනැගිල්ල ඉදිකිරීම | 250,000 .00 |
| 12 | | බැරිස්ටර්පුර ශු. වේලන්කන්නි දේවස්ථානයට විදුලි ජනක යන්ත්‍රයක් මිල දී ගැනීම සඳහා ප්‍රදානය කිරීම | 175,000 .00 |
| 13 | මන්නාරම | මන්නාරම පදවියේ දහම් පාසැල් 15 සඳහා උපකරණ මිල දී ගැනීම සඳහා ප්‍රදානය කිරීම | 750,000.00 |
| 14 | | මඩු කුංචිකුලම් දේවස්ථානයේ සීනු කුලුව ඉදිකිරීම සඳහා ප්‍රදානය කිරීම | 490,000.00 |
| 15 | | දහම් සේවා මධ්‍යස්ථානය සඳහා උපකරණ මිල දී ගැනීම | 517,926.25 |
| 16 | ගාල්ල | වැලිගම දොමිනිකානු පැවිදි ආරාමයේ ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් ප්‍රදානය කිරීම (වැසිකිළි පද්ධතිය) | 300,000.00 |

| | | | |
|---|---|---|---|
| 17 | කුරුණෑගල | කුරුණෑගල, මිල්ලව ශා. ජෝශප් වාස් දෙව්සත්හලේ ප්‍රතිසංස්කරණය සඳහා ප්‍රදානය කිරීම | 300,000.00 |
| 18 | දහම්පාසැල් පුස්තකාල සඳහා කබඩ් ලබා දීම | මුතුපන්තිය ශා. ජූඩ් දේවස්ථානය | 18,500.00 |
| 19 | | ගනේගම ශා. අන්තෝනි දේවස්ථානය | 16,500.00 |
| 20 | | ගෝනවිල, ශා. ජෝශප් දහම්පාසැල | 15,800.00 |
| 21 | | කුරුදුගහ ඇල්පිටිය දිව්‍ය හෘදය දේවස්ථානය | 14,917.50 |
| 22 | | ලුනාව පේදුරු පාවුළු දහම් පාසැල | 21,470.00 |
| 23 | | මීරිගම ජපමාල මාතා දහම්පාසැල | 13,500.00 |
| 24 | | නිට්ටඹුව, ශා. අන්තෝනි දහම්පාසැල | 17,266.25 |
| 25 | | ප්‍රා.ලේ. කාර්යාලය, තෙලිජ්ජවිල - වලිතුන්ඩාල් ශා. ආනා දහම්පාසැල | 14,500.00 |
| 26 | | ප්‍රා.ලේ. කාර්යාලය, තෙලිජ්ජවිල - කුලාමවෙල ශා. ෆ්‍රැන්සිස් සේවියර් දහම්පාසැල | 14,500.00 |
| 27 | | වාසලකෝට්ටේ ශා. අන්තෝනි සිද්ධස්ථානය | 13,990.00 |
| 28 | | ජපමාල දේවමාතා දේවස්ථානය, කුමාරකට්ටුව | 14,000.00 |
| 29 | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව අයිතියාමලෙ දේවස්ථානය | 36,400.00 |
| 30 | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව කල්ලාර් දේවස්ථානය | |
| 31 | | ඉනාමළුව දේවස්ථානය | 13,990.00 |
| 32 | ක්‍රිස්තියානි සභා - දකුනු ඉන්දියානු සභාව | කෑගල්ල, දේවාලේගම, මල්බෙරිවත්ත දේවස්ථානයට බංකු මිල දී ගැනීම සඳහා | 320,000.00 |
| 33 | ක්‍රිස්තියානි සභා - ලංකා සභාව | යාපනය නල්ලූර් ශා. ජේම්ස් දේවස්ථානයේ මීසම් ශාලාව ප්‍රතිසංස්කරණය සඳහා ප්‍රදානය කිරීම | 490,000 .00 |
| මුළු මුදල | | | 6,999,260.00 |

# පස්වන පරිච්ඡේදය

## ආර්ථික සහය අවශ්‍ය කිතුණු දේවස්ථානවල සංවර්ධන හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ආධාර ලබාදීම.

**ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව**

**ආර්ථික සහය අවශ්‍ය කිතුනු දේවස්ථාන හා ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය හා ප්‍රතිසංස්කරණය සඳහා මූල්‍ය සහය දැක්වීම**

**ආර්ථික දුෂ්කරතා සහිත දේවස්ථාන හා ආගමික මධ්‍යස්ථානයන්හී සිදු කෙරෙන සුළු පරිමාණ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මූල්‍ය සහාය දැක්වීම මේ යටතේ සිදු කෙරේ.**

- **දේවස්ථාන ආධාර. වැය ශීර්ෂය: 203-02-01-1508**

| | පදවිය | වැඩසටහන | මුදල |
|---|---|---|---|
| 1 | කොළඹ | කදාන ශා. සෙබස්තියන් සිද්ධස්ථානයේ ප්‍රතිසංස්කරණ කටයුතු | 500,000.00 |
| | | මග්ගොන කල්වාරි පුදබිමේ පහසුකම් සංවර්ධනය | 211,200.00 |
| | | මග්ගොන ශා. වින්සෙන්ති නිවසේ විදුලි පද්ධතිය නැවත සැකසීම | 133,603.01 |
| | | මරදාන පාතිමා මාතා දේවස්ථානයේ දහම්පාසැල් ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් ප්‍රදානය කිරීම | 308,000.00 |
| 2 | යාපනය | කච්චතිවු ශා. අන්තෝනි සිද්ධස්ථානයේ වාර්ෂික මංගල්‍යය වෙනුවෙන් (ප්‍රතිපාදන මාරුකිරීමකි) | 4,938,708.72 |
| 3 | | කිලිනොච්චි පලෛතිවු ශා. අන්තෝනි දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය වෙනුවෙන් ප්‍රදානය කිරීම | 60,000 .00 |
| 4 | කුරුණෑගල | මාවතගම කල්වාරි පුදබිමේ යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් | 321,000.00 |
| 5 | ගාල්ල | හිනිදුම කල්වාරි පුදබිමේ යටිතල පහසුකම් සංවර්ධනය | 300,000.00 |
| 6 | | ගනේගම ශා. මයිකල් කන්‍යාරාමයේ ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් ප්‍රදානය කිරීම | 200,000.00 |
| 7 | මහනුවර | වාසලකොට්ටේ වාර්ෂික මංගල්‍ය වෙනුවෙන් විදුලි ජනක යන්ත්‍රයක් කුලී පදනම මත ලබා ගැනීම | 287,310 . 86 |
| 8 | හලාවත | පල්ලෙකණ්ඩාල් ශා. අන්තෝනි දේවස්ථානයේ තාවකාලික වැසිකිළි ඉදිකිරීම සඳහා වන වියදම ප්‍රතිපූරණය | 180,000.00 |
| | | | 7,439,822.59 |

# හයවන පරිච්ඡේදය

## දේවස්ථාන ඉදිකිරීම් පුනුරුත්ථාපනය කිරීම හා යටිතල පහසුකම් සංවර්ධනය

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

**දේවස්ථානයන්හී ඉදිකිරීම්, පුනරුත්තාපනය කිරීම් හා යටිතල පහසුකම් සංවර්ධනය.**
**203-02-01-10-2502**

| අනු අංකය | පදවිය | විස්තරය | ලබා දුන් මුදල |
|---|---|---|---|
| 1 | කොළඹ | මීගමුව කටුවාපිටිය දේවස්ථානයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා | 200,000.00 |
| 2 | | පමුණුගම ශා. ජෝශප් දේවස්ථානයේ ප්‍රතිසංස්කරණය | 490,000.00 |
| 3 | | කඩවත ශා. අන්ද්‍රේ අවිල්ලීනු මුනි දේවස්ථානයේ ප්‍රතිසංස්කරණය | 250,000.00 |
| 4 | | කොලොන්නාව ශා. ජෝශප් දේවස්ථානයේ ප්‍රතිසංස්කරණය | 1,000,000.00 |
| 5 | | මාකොළ ශු. ජුසේ වාස් මුනි දේවස්ථානයේ ප්‍රතිසංස්කරණය | 300,000.00 |
| 6 | | මිරිස්වත්ත, යක්කල උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේගේ දේවස්ථානය සඳහා | 938,250.00 |
| 7 | | බොල්ලත ශ්‍රී හෘදය දෙව්මැදුරේ පුළුල් දේවස්ථානයේ ප්‍රතිසංස්කරණය | 450,000.00 |
| 8 | | පොල්පිතිමූකලාන කාමලයිට් නිකායේ පියතුමන්ලාගේ මූලස්ථානයේ ඉදිකිරීම් සඳහා ප්‍රදානය කිරීම | 450,000.00 |
| 9 | | අපෝස්තලික කාර්මෙල් නිකායේ කොල්ලුපිටිය ශා. තෙරේසා කන්‍යාරාමයේ වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම | 400,000.00 |
| 10 | හලාවත | පහරිය ජපමාල මාතා දේවස්ථානයේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් ප්‍රදානය කිරීම | 200,000.00 |
| 11 | | මාදම්පේ පොතුවිල ශා. ජූඩ් දේවස්ථානයේ වහළ වෙනුවෙන් ප්‍රදානය කිරීම | 400,000.00 |
| 12 | | බන්ඩිරිප්පුව ජපමාල දේවමාතා දේවස්ථානයේ දහම්පාසැල් ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ බිල්පත් ප්‍රතිපූරණය | 567,995.00 |
| 13 | ගාල්ල | බලපිටිය, නිර්දෝෂ දේවමාතා දේවස්ථානය ප්‍රතිසංස්කරණය | 200,000.00 |
| 14 | ක්‍රිස්තියානි සභා | මෙතෝදිස්ත සභාව - කොරළවැල්ල දේවස්ථානයේ ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් | 450,000.00 |
| 15 | | මෙතෝදිස්ත සභාව -මහරගම දේවස්ථානයේ ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් | 475,000.00 |
| 16 | | ලංකා සභාව - අනුරාධපුර මෛත්‍රී ක්‍රිස්තු දේවස්ථානයේ ප්‍රතිසංස්කරණය සඳහා | 100,000.00 |
| 17 | | මෙතෝදිස්ත සභාව - අක්කරෛපත්තු දේවස්ථානයේ ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් | 490,000.00 |

| | | | |
|---|---|---|---|
| 18 | | ලංකා සභාව - පොල්ගහවෙල ශා. අන්ද්‍රෑ දේවස්ථානයේ ප්‍රතිසංස්කරණය සඳහා | 300,000 . 00 |
| 19 | මන්නාරම | මුරුන්කන් ක්‍රිස්තු රජාණන්ගේ දේවස්ථානයේ ලූර්දු ගුහාව ඉදිකිරීම සඳහා ප්‍රදානය කිරීම | 586,000.00 |
| 20 | අනුරාධපුරය | මැදවච්චිය ජපමාල තාපසිකාරාමයේ ඉදිකිරීම් වලට අදාළ වියදම් ප්‍රතිපූරණය | 421,700.00 |
| 21 | | තිරප්පනේ ශා. තෙරේසා දේවස්ථානයේ ඉදිකිරීම් සඳහා | 200,000.00 |
| 22 | | පොළොන්නරුව නිර්මලී දේවස්ථානය ප්‍රතිසංස්කරණය | 300,000.00 |
| 23 | රත්නපුරය | රුවන්වැල්ල මොරාවත්ත ශා. ආනා දේවස්ථානය මීසම් ගෘහය ඉදිකිරීම | 200,000.00 |
| 24 | | හපුරුගල ශා. අන්තෝනි දේවස්ථානයේ ප්‍රතිසංස්කරණය වෙනුවෙන් | 400,000.00 |
| 25 | කුරුණෑගල | මොරොත්ත දේවස්ථානයේ ඉදිරිපස මණ්ඩපයේ වැඩ සම්පූර්ණ කිරීම සඳහා | 922,580.54 |
| 26 | | කුරුණෑගල, මාහොළුව දේවස්ථානයේ ප්‍රතිසංස්කරණය සඳහා ප්‍රදානය කිරීම | 450,000.00 |
| 27 | | කඩිගාව ජපමාල දේවමාතා දෙව්මැදුරේ දහම්පාසැල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ප්‍රදානය කිරීම | 450,000.00 |
| 28 | | කුරුණෑගල, වැල්ලව ශා. ෆ්‍රැන්සිස් සේවියර් දේවස්ථානයේ ප්‍රතිසංස්කරණය සඳහා ප්‍රදානය කිරීම | 450,000.00 |
| 29 | මඩකලපුව | වාලච්චේන, ශා. තෙරේසා දේවස්ථානයේ ප්‍රතිසංස්කරණය වෙනුවෙන් | 300,000.00 |
| 30 | ත්‍රිකුණාමලය | මුතූර් ගංගෙෙ ශා. පීතර දේවස්ථානය ප්‍රතිසංස්කරණය | 490,000.00 |
| 31 | | ලිංගානගර් ශා. ජූඩ් දේවස්ථානය ප්‍රතිසංස්කරණය සඳහා | 490,000.00 |
| 32 | | ඇලිස් ගාඩ්න් මඩු දේවමාතා දේවස්ථානය ප්‍රතිසංස්කරණය | 490,000.00 |
| 33 | | වෙල්වෙරි ශා. ජේම්ස් දේවස්ථානය ප්‍රතිසංස්කරණය | 490,000.00 |
| 34 | මහනුවර | වාසලකෝට්ටේ සිද්ධස්ථානයට ජෙනරේටරය ලබා දීමේ මූලික කටයුතු (පිරිවිතර ලබා ගැනීම) | 1,023,046.90 |
| 35 | | මහනුවර යහපත් එඬේරාගේ කන්‍යාරාමයේ පැති බැම්ම සඳහා ප්‍රදානය කිරීම | 300,000.00 |
| 36 | ජාතික | පැ.තු.නි. ෆ්‍රැන්සිස්කන් මූලස්ථානයේ ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ බිල්පත ප්‍රතිපූරණය | 450,000.00 |
| මුළු මුදල | | | 16,074,572.44 |

# හත්වන පරිච්ඡේදය

## කිතුණු දහම් අධ්‍යාපන කටයුතු නංවාලීම සහ දහම්ගුරු සේවා ඇගයීම් කටයුතු ක්‍රියාත්මක කිරීම.

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

## දහම් අධ්‍යාපන කටයුතු නංවාලීම සහ දහම්ගුරු සේවා ඇගයීම් කටයුතු ක්‍රියාත්මක කිරීම

රටක සංවර්ධනය භෞතික හා අධ්‍යාත්මික යන දෙයාකාරයෙන්ම සිදුවිය යුතුය යන්න රජයේ සංකල්පයයි. එය යථාර්තයක් බවට පත් කරනු වස් 2018 වසර තුළදී ක්‍රියාත්මක වූ වැඩසටහන් පහත පරිදි වේ.

## 01. දහම් පාසල් ගුරුභවතුන්ට නිළ ඇඳුම් ලබා දීම.

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව දහම් පාසල් අධ්‍යාපනය නංවනු වස්, ඒ සඳහා කැපවී ක්‍රියාකරන දහම් පාසල් ගුරුභවතුන්ට නිල ඇඳුම් ලබා දීම සිදු කෙරේ.

පදිවි 12 ම ආවරනය වන පරිදි පැවිදි ගුරුවරුන් 1008 ක් පිරිමි 2138 ක් සහ සාරි 11867 ක් බෙදා දීමට නියමිතව තිබුණි.නමුත් සාරි නිසි ප්‍රමිතියට නොමැති හෙයින් දැනට සාරි 2376 ක ප්‍රමාණයක් බෙදා දී අවසන් කර ඇත.ඉතිරි සාරි ප්‍රමාණය 2019 වර්ෂයේ මුල් කාර්තුවේ බෙදා දීමට සුදානම් කර ඇත. 2017 වසරේ නිල ඇඳුම් මිල දී ගැනීම සඳහා රු.මි 13 ක ප්‍රමාණයක් අක් මුදල් නොලැබීම මත 2018 වසරේ ප්‍රතිපාදන මගින් ලබා ගැනීමට සිදු විය.

### කතෝලික දහම් ගුරු ව්‍යාප්තිය පහත පරිදි වේ.

| පදවිය | පැවිදි ගුරුවරුන් | ගුරුවරුන් | ගුරුවරියන් | එකතුව |
|---|---|---|---|---|
| කොළඹ | 311 | 1102 | 4688 | 6101 |
| හලාවත | 109 | 329 | 2076 | 2514 |
| කුරුණෑගල | 52 | 127 | 747 | 926 |
| මහනුවර | 81 | 99 | 648 | 828 |
| රත්නපුර | 53 | 63 | 350 | 466 |
| අනුරාධපුර | 30 | 30 | 170 | 230 |
| බදුල්ල | 37 | 17 | 251 | 305 |
| ගාල්ල | 51 | 25 | 132 | 208 |
| යාපනය | 105 | 135 | 1282 | 1522 |
| මන්නාරම | 99 | 110 | 751 | 960 |
| මඩකලපුව | 46 | 73 | 477 | 596 |
| ත්‍රිකුණාමලය | 30 | 24 | 218 | 272 |
| එකතුව | 1008 | 2138 | 11867 | 15013 |

| | |
|---|---|
| පැවිදි ගුරුවරු සංඛ්‍යාව | 1008 |
| ගුරුවරුන් | 2138 |
| ගුරුවරියන් | 11867 |
| මුළු එකතුව | 15013 |

## 02. දහම් ගුරුභවතුන් හට රු. 5,000/- ක පුස්තකාල පොත් මිළදී ගැනීමේ දීමනාව ලබාදීම

| | පදවිය | දහම් ගුරුවරු සංඛ්‍යාව | පුස්තකාල පොත් දීමනාව (රු.) |
|---|---|---|---|
| 1 | කොළඹ | 6101 | 30,505,000.00 |
| 2 | හලාවත | 2514 | 12,570,000.00 |
| 3 | කුරුණෑගල | 926 | 4,630,000.00 |
| 4 | මහනුවර | 913 | 4,565,000.00 |
| 5 | රත්නපුර | 466 | 2,330,000.00 |
| 6 | අනුරාධපුර | 230 | 1,150,000.00 |
| 7 | බදුල්ල | 305 | 1,525,000.00 |
| 8 | ගාල්ල | 208 | 1,040,000.00 |
| 9 | යාපනය | 1522 | 7,610,000.00 |
| 10 | මන්නාරම | 960 | 4,800,000.00 |
| 11 | මඩකලපුව | 596 | 2,980,000.00 |
| 12 | ත්‍රිකුණාමලය | 272 | 1,360,000.00 |
| | එකතුව | 15013 | 75,065,000.00 |

## කිතුනු දහම් අධ්‍යාපන කටයුතු නංවාලීම සඳහා දහම් ගුරුභවතුන් හා සිසුන් වෙනුවෙන් සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවත්වීම

මෙම වැය විෂය යටතේ එක් එක් වසරේ වෙන් වන ප්‍රතිපාදන වලින් දහම් දැනුමින් ජනතාව පෝෂණය කර කිතුනු වටිනාකම් ජනතාව තුල ගොඩනංවීම අරමුණු කරගෙන සංවිධානය කරන වැඩසටහන් සඳහා දායකත්වය ලබා දීම සිදු කෙරේ.

2018 වසර වෙනුවෙන් ජාතික මට්ටමෙන් දිවයිනම ආවරණය කරන වැඩසටහන් සඳහා ද, කතෝලික රදගුරු පදවි මට්ටමින් ද, දිසා හා දහම්පාසල් මට්ටමින් ද දේවස්ථාන වල ද ආයතන වල ද කිතුනු ගුරුවරුන් හා සිසුන්ගේ දහම් දැනුම වැඩිදියුණු කර යහපත් ජීවිතයක් ලබා දීමේ අරමුණින් සංවිධානය කරන මෙවැනි වැඩසටහන් සඳහා ද ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයට අයත් සාම්ප්‍රදායික ක්‍රිස්තියානි සභාවන් හි දේවස්ථාන මට්ටමින් සහ ආයතන වල සංවිධානය කරනු ලබන දහම් අධ්‍යාපන වැඩසටහන් සඳහා ද දායකත්වය ලබා දෙන ලදී.

මේවාට අමතරව දහම් පාසැල් සිසුන් අතර සහජීවනය සාමුහිකත්වය වැනි ගුණාංග වර්ධනය කරනු වස් සංවිධානය කරනු ලබන රැළි, කඳවුරුවැනි වැඩසටහන් සඳහා මෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්තව සේවය කරනු ලබන අප දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිළධාරීන් විසින් තම ප්‍රදේශ තුල කතෝලික හා ක්‍රිස්තියානි දේවස්ථාන වල දහම් පාසල් සිසුන් සහ ගුරුවර ගුරුවරියන් වෙනුවෙන් වැඩසටහන් සංවිධානය කිරීම සඳහා ද දායකත්වය ලබා දෙන ලදී.

ඉදිරිපත් වන ඉල්ලීම් අනුව සෑම කතෝලික පදවියකම සහ ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයට අනුබද්ධ සාම්ප්‍රදායික ක්‍රිස්තියානි සභාවකම උපරිම වැඩසටහන් සංඛ්‍යාවකට දායකත්වය ලබා දීමට හැකි වන ලෙස ප්‍රදානයන් සිදු කරන ලද අතර එක් එක් පදවි හා සභාවන් සඳහා සැලකිල්ලට ගෙන ප්‍රදානයන් ලබා දීමට කටයුතු කරන ලදී.

### 2018 දහම් පාසල් ක්‍රියාකාරකම් සහ ආගමික අධ්‍යාපන වැඩමුළු

| | පදවිය | වැඩසටහන | මුදල (රු.) |
|---|---|---|---|
| 1 | කුරුණෑගල | නව දහම් ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන | 20,000.00 |
| 2 | | දහම් ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන | 20,000.00 |
| 3 | | රජයේ ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් | 15,000.00 |
| 4 | | සංවර්ධන නිළධාරින් මගින් විශේෂ අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම | 30,000.00 |
| 5 | කොළඹ | දහම් ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන | 100,000.00 |
| 6 | | දහම් ගුරුවරුන් සඳහා ප්‍රායෝගික පරීක්ෂණ | 50,000.00 |
| 7 | | ළමා දිනය වෙනුවෙන් වැඩසටහන් | 50,000.00 |
| 8 | | අධ්‍යාපන වැඩසටහන් | 58,060.00 |

| | | | |
|---|---|---|---|
| 9 | මහනුවර | අ.පො.ස උ.පෙළ සිසුන් සඳහා කතෝලික ධර්මය පිලිබද සම්මන්ත්‍රණ | 20,000.00 |
| 10 | | ධර්මාචාර්ය විභාගය සඳහා සම්මන්ත්‍රණ 3ක් පැවැත්වීම | 60,000.00 |
| 11 | | ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් | 20,000.00 |
| 12 | බදුල්ල | ධර්මාචාර්ය විභාගය සඳහා සම්මන්ත්‍රණ 2ක් පැවැත්වීම | 42,000.00 |
| 13 | | අ.පො.ස උ.පෙළ සිසුන් සඳහා කතෝලික ධර්මය පිලිබද සම්මන්ත්‍රණ | 20,000.00 |
| 14 | යාපනය | අධ්‍යාපන වැඩසටහන් 4ක් පැවැත්වීම | 100,000.00 |
| 15 | | සංවර්ධන නිළධාරින් මගින් වැඩසටහන් 25ක් පැවැත්වීම | 270,000.00 |
| 16 | මන්නාරම | සංවර්ධන නිළධාරින් මගින් වැඩසටහනක් පැවැත්වීම | 10,000.00 |
| 17 | මඩකලපුව | අ.පො.ස සා.පෙළ සිසුන් සඳහා කතෝලික ධර්මය පිලිබද සම්මන්ත්‍රණ | 10,000.00 |
| 18 | | සංවර්ධන නිළධාරින් මගින් වැඩසටහන් 04ක් පැවැත්වීම | 40,000.00 |
| 19 | | අධ්‍යාපන වැඩසටහන් | 10,000.00 |
| 20 | රත්නපුර | දහම් පාසැල් සිසුන් සඳහා විශේෂ අධ්‍යාපන වැඩසටහන් | 15,000.00 |
| 21 | | අ.පො.ස සා.පෙළ සිසුන් සඳහා කතෝලික ධර්මය පිලිබද සම්මන්ත්‍රණ | 25,000.00 |
| 22 | | අධ්‍යාපන වැඩසටහන් | 24,260.00 |
| 23 | | සංවර්ධන නිළධාරින් මගින් වැඩසටහන් 03ක් පැවැත්වීම | 30,000.00 |
| 24 | හලාවත | නව දහම් ගුරුවරුන් සඳහා විශේෂ පුහුණු වැඩසටහන | 150,000.00 |
| 25 | | සංවර්ධන නිළධාරින් මගින් වැඩසටහන් 04ක් පැවැත්වීම | 40,000.00 |
| 26 | | අ.පො.ස උ.පෙළ සිසුන් සඳහා කතෝලික ධර්මය පිලිබද සම්මන්ත්‍රණ | 50,000.00 |
| 27 | ත්‍රිකුණාමලය | දහම් ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් 4ක් පැවැත්වීම | 30,000.00 |
| 28 | ජාතික | ජාතික කතෝලික සහ බයිබල් වැඩසටහන් | 1,500,000.00 |
| 29 | ක්‍රිස්තියානි | තරුණ වැඩසටහන් | 300,000.00 |
| | | එකතුව | 3,179,320.00 |

**දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්තව සේවය කරනු ලබන අප දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිළධාරීන් විසින් තම ප්‍රදේශ තුල කතෝලික හා ක්‍රිස්තියානි දේවස්ථාන වල දහම් පාසල් සිසුන් සහ ගුරුවර ගුරුවරියන් වෙනුවෙන් සංවිධානය කල වැඩසටහන්**

| අනු අංකය | පදවිය | සංවර්ධන නිලධාරියාගේ නම සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | වැඩසටහන | මුදල | |
|---|---|---|---|---|---|
| 1 | යාපනය | ජේ. වයි. ප්‍රේම්නාත් මිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය | පවුල් වැඩසටහන | 10000 | 160,000.00 |
| 2 | | | තරුණ වැඩසටහන | 10000 | |
| 3 | | | මත්ද්‍රව්‍ය වැඩසටහන | 10000 | |
| 4 | | සී.මේරි කැලස්ටා මිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම | පවුල් වැඩසටහන | 10000 | |
| 5 | | | තරුණ වැඩසටහන | 10000 | |
| 6 | | | මත්ද්‍රව්‍ය වැඩසටහන | 10000 | |
| 7 | | ජේසුදාසන් ජේසුරත්නම් මයා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බටහිර වලිකාමම්, චන්කනෛ | පවුල් වැඩසටහන | 10000 | |
| 8 | | | මත්ද්‍රව්‍ය වැඩසටහන | 10000 | |
| 9 | | ඒ.ජේ.ජේ මරීඩා මිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සන්දිලිප්පේ | පවුල් වැඩසටහන | 10000 | |
| 10 | | | තරුණ වැඩසටහන | 10000 | |
| 11 | | | මත්ද්‍රව්‍ය වැඩසටහන | 10000 | |
| 12 | | ඇග්නස් ශෂිකුමාර් මිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තෙලිප්පලෙයි | පවුල් වැඩසටහන | 10000 | |
| 13 | | | තරුණ වැඩසටහන | 10000 | |
